# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත

## பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்

## CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE


| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/03/01/i/පොදු | ඔබේ අංකය<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2022.05 09 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්/සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

**<u>පරිවර්තිත ගමන් වියදම් දීමනාව සඳහා පොදු නිර්දේශයක් සකස් කිරීම</u>**

උක්ත මැයෙන් යුතු ජාතික වැටුප් කොමිෂන් සභා ලේකම් ගේ අංක NPC/03/GP/01 හා 2022.04.26 දිනැති ලිපියෙහි පිටපතක් මේ සමග ඔබ වෙත එවමි.

02 ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා ගෙවනු ලබන පරිවර්තිත ගමන් වියදම් දීමනා සම්බන්ධයෙන් පොදු නිර්ණායකයන් මත පදනම් වූ නිර්දේශයන් සකස් කිරීමේ අවශ්‍යතාවයක් පවතින බව එහි සඳහන් කර ඇත.

03. මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා ඔබ අමාත්‍යාංශය තුළ හෝ එයට අයත් ආයතන සඳහා අනුමත කාර්යය මණ්ඩල තුළ ක්ෂේත්‍ර රාජකාරිවල නිරත වන ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා පරිවර්තිත ගමන් වියදම් දීමනා ගෙවන්නේ නම් එම පරිවර්තිත ගමන් වියදම් පිළිබඳ තොරතුරු ඇමුණුම 01 මගින් දැක්වෙන ආකෘතිය අනුව සම්පූර්ණ කර, ඔබගේ නිර්දේශ සහිතව, මටද පිටපතක් සමග එහි මෘදු පිටපතක් npcallowances@gmail.com යන විද්‍යුත් තැපැල් ලිපිනයට සතියක කාලයක් ඇතුලත යොමු කරන ලෙස,කාරුණිකව දන්වමි. ( මාගේ විද්‍යුත් තැපැල් ලිපිනය chiefsec03@gmail.com )

04 මේ සම්බන්ධයෙන් ඔබට අයත් ආයතනවල ආයතන ප්‍රධානීන් ද දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

ආර්. සී. ද සොයිසා,
ප්‍රධාන ලේකම්
දකුණු පළාත.

ආර්. සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

පිටපත :- ලේකම්,ජාතික වැටුප් කොමිෂන් සභාව. - කරු. අ.ක.ස


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary: 091 4944002
කාර්යාලය / காரியாலயம் / Office: 091 4119011, 091 2226118
ෆැක්ස් / பெக்ஸ் / Fax: 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail: chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இ தளம் / Web site: www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக்க மாவத்தை, காலி.


"සෞභාග්‍යමත් දකුණු පළාතක්"